# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා 2019.07.08 දින තෙක් මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

## 01. <u>මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම්:**

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ විභාගය සමත් වීම හා එම සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු වශයෙන් අවුරුදු 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් ක්‍රමය:** 2018.06.01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016(v) අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 [U MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.28,607.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

## 02. <u>විනයාරක්ෂක (II ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම.

ii. ශාරීරික සුදුසුකම්: පිරිමි - උස අඩි 5 අඟල් 5 ට නොඅඩු විය යුතුය.
පපුව අඟල් 32 (සාමාන්‍ය) ක් විය යුතුය.

ගැහැණු - උස අඩි 5 අඟල් 4 ට නොඅඩු විය යුතුය.

iii. වයස අවුරුදු 30 ට වැඩි විය යුතුය.

**සටහන:** පොලිස් / සන්නද්ධ හමුදා සේවා පසුබිමක් ඇති සහ විශ්වවිද්‍යාල හා ජාතික මට්ටමේ ක්‍රීඩා කටයුතු හා සමාජ සුභසාධක කටයුතුවලදී ක්‍රියාකාරී ලෙස සහභාගී වී ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවේ මේජර් තනතුරට වඩා නොඅඩු තනතුරක සේවා පළපුරුද්ද ඇති හෝ ශ්‍රී ලංකා පොලිස්සියේ ඉහත තනතුරට සමාන හෝ ඊට නොඅඩු තනතුරක සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් ක්‍රමය:** 2018.06.01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016(v) අනුව 2020.01.01 දින සිට රු.42,885 - 18×660 - 54,765.00 [U MN 3(II) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.38,717 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

## 03. විගණන සහකාර (II ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම්:**

(a) අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ සම්මාන සාමාර්ථ 02 ක් සහිතව විෂයයන් 04 කින් සමත් වීම හෝ නව නිර්දේශය යටතේ සම්මාන සාමාර්ථ 02 ක් සහිතව විෂයයන් 03 කින් සමත් වීම සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය හා ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ ලබා තිබීම.

සහ

(b) (i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ප්‍රාථමික අදියර/ආවසරික 1/පදනම් අදියර සමත් වී තිබීම.

හෝ

(ii) ශ්‍රී ලංකා වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ පදනම් අදියර සමත් වීම

හෝ

(iii) කොමිෂන් සභාව විසින් ඉහත (b) i සහ (ii) ට සමාන ලෙස සලකනු ලබන වෙනත් සුදුසුකම්

සහ

(c) රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර 02 ක විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද

**සටහන:** අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ/රාජ්‍ය අංශයේ/පිළිගත් පෞද්ගලික සංවිධානයන්හි ගණකාධිකරණ/ විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඉහත (c) හි සඳහන් විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද වෙනුවෙන් සලකා බලනු ඇත.

**වැටුප් ක්‍රමය:** 2018.06.01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016(v) අනුව 2020.01.01 දින සිට රු.37,275 - 18×495 - 46,185.00 [UMN 2(II)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.33,717 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

## 04. පරිපාලක - භූමිදර්ශක (පහළ ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

1. (අ) (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත් වීම.

සහ

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හෝ ඊට සමාන ආයතනයක් විසින් පවත්වනු ලබන එක් අවුරුදු ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම.

(ආ) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සහ/හෝ උද්භිද උද්‍යානයක භූමිදර්ශන කටයුතු පිළිබඳ වසර 10 ක අත්දැකීම් ලබා ඇති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු සේවකයෙක් වීම.

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 - මාසික [U-MT 1(IIIA)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.28,607.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

***සැ.යු. අංක 01 - 04 දක්වා තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සම්මුඛ පරීක්ෂණයක් මගිනි.***

## 05. තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය) "අ" ඛණ්ඩය තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. (අ) තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හෝ ඊ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

හෝ

(ආ) ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ඇ) අදාල විෂය ක්ෂේත්‍රය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ඈ) අදාල විෂය ක්ෂේත්‍රය සම්බන්ධව පිළිගත් ආයතනයකින් ලබා ගන්නා ලද වසර 02 ක පූර්ණ කාලීන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ වසර 01පළපුරුද්දක් තිබීම.

**සටහන:** අදාල තනතුරේ ස්වභාවය අනුව කෘෂි කර්මය / සත්ව පාලනය / ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණය / වෛද්‍ය රසායනාගාර තාක්ෂණය ආදී විෂයන් විෂය ක්ෂේත්‍රයන් වශයෙන් සලකනු ලබන අතර එම ක්ෂේත්‍රයන්හි පිළිගැනීම පීඨයේ අවශ්‍යතාවය මත තීරණය කරනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 2018.06.01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.35,145.00 - 7×355; 9×495 - 42,088.00 [U-MT 1(II)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.31,788.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

***බඳවා ගැනීම : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.***

## 06. තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ - III ශ්‍රේණිය) තනතුර

i. (අ) අපොස (උ/පෙළ) පරීක්ෂණය විද්‍යා විෂය ධාරාව යටතේ එකවරකදී විෂයන් 3 කින් සමත් වී තිබීම. විෂය සංකලනය / සංකලන අධ්‍යනාංශයේ නිර්දේශය මත අදාල පීඨය මගින් තීරණය කරන පරිදි වේ.

සහ

(ආ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම විසින් අනුමත කරන ලද තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු සන්නිවේදන සහ බහු මාධ්‍ය තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය /තොරතුරු තාක්ෂණය පිළිබඳව නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය සුදුසුකමෙහි 05 වන මට්ටම ( NVQ 5 Level 5) හෝ ඊට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

ii. වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු වේ.

**සටහන:** තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 2018.06.01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 [UMT 1(IIIA)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.28,607.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

***බඳවා ගැනීම: ලිඛිත / ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.***

## 07. ජලනල කාර්මික (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. අටවැනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුයි.

ii. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණතාවයක් ලබා සිටිය යුතුය.

(අ) අඟලෙන් 1/64 දක්වා පරිමාණයෙන් කියවීමට හැකියාව සහ ආයුධ නඩත්තු කිරීම හා ඒවායේ වත්මන් භාවිතය.
(ආ) නොයෙකුත් පිරිද්දුම් ඇතුළත්ව සී.අයි, ජී.අයි. සහ ඊයම් පයිප්ප දැමීම සහ ඒවා පරීක්ෂා කිරීම.
(ඇ) බෝල් වැල්වයන්, ජල භාජන ආදිය අළුත්වැඩියා කිරීම සහ සරල ඇඳීම් සටහන් කියවීමට හා තේරුම් ගැනීමට හැකියාව ආදිය පිළිබඳව දැනීම තිබිය යුතුය.

iii. ජලනල කර්මාන්තය පිළිබඳව වසර 02 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.29,915 - 16×270 - 34,235.00[ U-PL 3(III) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.27,062.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

## 08. තවාන් කරු (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. අටවැනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුයි.

ii. දඬුකැබලි මුල් ඇද්දවීම, අතුබැඳීම, ආරුක්කු බද්දය, අංකුර බද්දය, රිකිලි බද්දය වැනි සියලුම ශාක ප්‍රචාරණ ක්‍රම පිළිබඳ සහ පැල බඳුන්ගත කිරීම තවාන් කළමනාකරණය සහ කප්පාදුව ආදී කටයුතු පිළිබඳ හසල දැනුමක් පැවතිය යුතුය.

iii. ගොවිපලේ හෝ උද්‍යානයේ වගාකර ඇති විවිධ ශාක විශේෂ හා බීජ වර්ග හඳුනා ගැනීමට හැකිවිය යුතුය.

iv. තවානෙන් භාහිරට ගෙන යන පැල විධිමත්ව ඇසිරීම පිළිබඳ දැනුමක් පැවතිය යුතුය.

v. තවාන් කරුවෙකු ලෙස අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් පැවතිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.28,025 - 16×270 - 32,345.00 [U-PL 2(III)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.25,354/= වැටුපෙහි පිහිටුවනු ලැබේ.

## 09. පෙදරේරු (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම් :**

i. 8 ශ්‍රේණිය සමත් වීම.

ii. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණතාවක් ලබා සිටිය යුතුය.

(අ) ගඩොල් බැඳීමේදී භාවිතා වන විවිධ ආකාරයේ බැම් රටා යොදාගෙන බිත්ති පාදම්, ආරුක්කු, කේතුමය කණු, දුම් කවුළු, කසල වලවල් ආදිය බැඳීමේ හැකියාව.
(ආ) විවිධ නිමාවලින් යුතු කපරාරු කිරීමේ හැකියාව, කම්බි යොදා කොන්ක්‍රීට් මිශ්‍රණය සාදාගෙන කොන්ක්‍රීට් දැමීමේ හැකියාව.
(ඇ) සාමාන්‍ය ඉදිකිරීම් සඳහා අඳිනු ලබන සැලැස්මට අනුකූලව අත්තිවාරම් සීමා සලකුණු කිරීමේ හැකියාව.

(ඇ) ඉමල්ෂන් තීන්ත ද ඇතුළුව තීන්ත ආලේප කිරීමේ හැකියාව.

iii. පෙදරේරුවෙකු ලෙස වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.29,915 - 16×270 - 34,235.00[ U-PL 3(III) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ.2019 වර්ෂය සඳහා රු.27,062.00 වැටුපෙහි පිහිටුවනු ලැබේ.

## 10. <u>ගෘහස්ත ක්‍රීඩාංගණ සහයක (පහළ ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම්:**

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් සමත්විය යුතුය.
(ii) ගෘහස්ථ ක්‍රීඩාංගණ භාණ්ඩ හා ව්‍යායාම උපකරණ භාවිතය හා නඩත්තුව පිළිබඳ දැනුමක් තිබීම.
(iii) ගෘහස්ථ ක්‍රීඩාංගණ නඩත්තුව පිළිබඳ වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් තිබීම.
(iv) ගෘහස්ථ ක්‍රීඩා පිළිබඳ දැනුම. (අත්පන්දු,බැඩ්මින්ටන්,පැසිපන්දු හා මේස පන්දු ආදී)

**වැටුප් පරිමාණය**: 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක17/2016 අනුව 2020.01.01 දින සිට රු.28,025 -16×270 - 32,345.00 [UPL2(III)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. 2019 වර්ෂය සඳහා රු.25,354/= වැටුපෙහි පිහිටුවනු ලැබේ.

***සැ.යු. අංක 06 - 09 දක්වා තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.***

**වෙනත් කරුණු:**

- වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

- ඉහත මාසික වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

- විශ්වවිද්‍යාල සේවකයින් සිය මාසික මූලික වැටුපෙන් 10% කින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් 15% කට සමාන මුදලක් (8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප සඳහා ද, 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද බැර කෙරේ. විශ්වවිද්‍යාල පද්ධතියෙහි පත්වීම් දිනයේ සිට අනිවාර්ය විශ්‍රාම යාමේ දිනය දක්වා, එනම් වයස අවු. 60 දක්වා වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට නොහැකි වන කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුපට දායක නොවන අතර, එම කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකත්වය ද නොදරයි.) දායක කරනු ලැබේ.තවද ආයතනය විසින් මූලික වැටුපෙන් 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා බැර කරනු ලැබේ.

**අයදුම්පත් නිකුත් කිරීම සහ භාර ගැනීම:**

අයදුම්කරුගේ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ සෙ.මී. 22×10 ප්‍රමාණයේ ලියුම් කවරයක් මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත එවීමෙන් හෝ ආයතන අනධ්‍යයන අංශයට පැමිණ හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියට පිවිසීමෙන් (www.ruh.ac.lk) නියමිත ආකෘති පත්‍රය හා බඳවා ගැනීම් පරිපාටියට අදාළ තොරතුරු ලබාගත හැකිය. 2019.07.01 දින තෙක් පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

නියමිත ආකෘතිය භාවිතා කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් "ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන), රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන ලද තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ හෝ අපැහැදිලි හෝ ඉහත සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සපුරා නොතිබීම හෝ නියමිත දිනට පෙර එවීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කවර හේතුවක් නිසා හෝ නැවත සලකා බැලීමට අවකාශ නොමැත.

රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් සිය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රුහුණ විශ්වවිද්‍යාලය, ලේඛකාධිකාරී
වැල්ලමඩම,
මාතර.
2019.06.14